# ශ්‍රී ලංකා සමාජය තුළ ආගමේ කාර්ය භාරය

සංස්කෘතියේ ආරම්භයේ සිටම මානව ක්‍රියාකාරකම් සමග බැඳී පැවති මූලිකාංගයකි ආගම. (Religion) රිලිජන් හෙවත් ආගම යන පදය ලතින් භාෂාවේ (Relegere) රිලීජරි හෙවත් (To observe) සමාදන් වීම, සැලකිළිමත් වීම රැකීම යන අර්ථයෙන් ඉදිරිපත් වී ඇති බව මානව විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. ආගම පිළිබඳ හැඟීම පාදක කොට ගෙන සෑම සංස්කෘතියකට ම අයත් ජනතාව විසින්ම යම් යම් විශ්වාස ගොඩ නගා සිටිනවාක් මෙන්ම ඒ ඔස්සේ විවිධාකාර ක්‍රියාවන් හී ද නියැලී සිටිති. මෙම විශ්වාස ඇදහිලි ආදී සියල්ලම පොදුවේ විභාග කරන විට ආගම පුළුල් සමාජ සම්මුතියක් ලෙස සැලකීමට සිදුවේ. සමාජයක් ගොඩනැගී පවතින්නා වූ සාරධර්ම ඇගයුම් හා ආකල්ප ප්‍රකට කරන මාධ්‍යයක් හැටියට ආගම සමාජය සමග පවත්වාගන යන මෙම ගෞරවාන්විත වූ සම්මුතිය සෑම සමාජයකටම පොදු වූවකි. අනෙක් අතට ආගමික මතවාද හා අරමුණු එකිනෙකින් විවිධ වූවත්, ඒ හැම එකකම අවසාන ඵලය සමාජයට හිතකර සමාජානුයෝගී පුද්ගලයකු බිහි කිරීම බව ද පෙනේ. එපමණකුත් නොව, ආගම සමාජය තුළ පවතින ප්‍රධාන ම සමාජීය සංස්ථාවක් ද වේ. එය සමාජය තුළින්ම උපත ලබා එයම පෝෂණය කරන කෘත්‍යමය කාරකයක්ය යන අදහස ද කෘත්‍යවාදී සමාජ මානව විද්‍යාඥයින්ගේ පිළිගැනීමකි.

ආගමේ ප්‍රභවය පිළිබඳව මූලික සිද්ධාන්තය ඉදිරිපත් කළේ එඩ්වර්ඩ් ටයිලර් (1832 - 1917) යන සම්භාව්‍ය මානව විද්‍යාඥයා විසිනි. ඔහු ආගමේ උපත විග්‍රහ කළේ ආත්මය නැවතත් ඉපදීම ලෙසයි. මිනිසාගේ මරණයත් සමඟ ඔහු වෙතින් ඉවත්වන ආත්මය පෙරලා ජීවත්ව සිටින අයට බලපෑම් කරන බවත්, එම බලපෑම හේතු කොට ගෙන ආත්මයට වැඳුම් පිදුම් කිරීමට ජනතාව පෙළඹෙන බවත් දක්වන ටයිලර්, මෙම ආත්මය නැවත නැවත ඉපදීම සර්වාත්මවාදය (Animism) ලෙසින් නම් කරයි. මෙසේ මියගිය පුද්ගලයකුගේ ආත්මය මූලික වී ඇති වූ චින්තනය ආගම් වල ආරම්භය වූ බැවින්, ආගම හැඳින්විය හැක්කේ අධිභෞතික සත්වයන් හෙවත් ප්‍රත්‍යක්ෂයට ගෝචර නොවන සත්වයන් පිළිබඳව මිනිසා තුළ පවතින විශ්වාස ලෙසිනැයි ඔහු වැඩි දුරටත් දක්වයි.

මෙම පියවි ඇසට නොපෙනෙන බලවේග ඔස්සේ ආගම බිහිවූවාය යන මතය දැරූ තවත් මානව විද්‍යාඥයෙකි, ආර්. ආර්. මැරාට්. ඔහු මෙම බලවේගය හඳුන්වන්නේ මාන (Mana) යන සුවිශේෂී අර්ථයෙනි. නැගෙනහිර ශාන්තිකර දූපත් වල ජනතාවගේ ආගමික විශ්වාසය පිළිබඳව පර්යේෂණයක් කළ මැරාට් මෙම මාන යන බලවේගය මුළු විශ්වය පුරාම පැතිරී ඇතැයි යන විශ්වාසය ඔවුන් දැරූ බැව් පෙන්වා දෙයි. ලෝකය පුරාම ව්‍යාප්ත වී ඇති එම බලය එකට එක්කාසු කළ විට ගොඩනැගෙන බලවේගය සජීවී දෘෂ්ටියක් වන (Animatism) බව ද ඔහු පැහැදිලි කර දෙයි.

ආගම පිළිබඳ මෙම සම්භාව්‍ය මතිමතාන්තර වලට පරිබාහිරව එය සමාජීය සංස්ථාවක් ලෙස හඳුනාගැනීමට උත්සුක වූ සමාජ විද්‍යාඥයින් හා මානව විද්‍යාඥයින් කිහිප දෙනෙක්ම සිටිති. එමිල් ඩුර්කයිම්, ටැල්ප් එච්. ටර්නර් යන සමාජ විද්‍යාඥයින් එහිලා මූලික දෙදෙනෙකි. එමිල් ඩුර්කයිම් නම් ප්‍රංශ සමාජ විද්‍යාඥයා ආගමේ ප්‍රභවය ශුද්ධ (Sacred) වස්තූන් වෙතින් සිදුවූයේය යන මතය ඉදිරිපත් කරමින් ආගම පිළිබඳ මෙබඳු නිර්වචනයක් ඉදිරිපත් කරන ලදී.

"Religion is a unified system of belief and practices related to sacred things, uniting into a single moral community all those who adhere to those beliefs and practices"

"ආගම වනාහී ශුද්ධයයි සම්මත විශ්වාසයන් හා භාවිතයන් සමූහයක් වටා ගෙතුණු අන්තර් රද පැවැත්මක් ඇති විශ්වාසයන් හා භාවිතා ක්‍රමයක් මගින් සමාජයක සියල්ලන්ම එක් සදචාර ප්‍රජාවක් ලෙසට සංවිධානය කරන ආයතනයකි." මෙම අදහසට අනුව ආගම පැන නගින්නේ ශුද්ධ යැයි සම්මත විශ්වාසයන් හා භාවිතයන් සමූහයක් වෙතිනි. දෙවනුව ඒවා පෙරදැරි කරගෙන සමාජයේ සියල්ලම එක පොදු හැඟීමකින් එකට සංවිධානය කිරීමක් ආගම වෙතින් ඉටුවේ. ශුද්ධ යන වචනයෙන් ඩූර්කයිම් අදහස් කළේ දෙවියන් හෝ ඒ හා සම්බන්ධ හෝ දේවල් පමණක් නොවේ. ඕනෑම දෙයක් කැබැල්ලක් ශුද්ධ වස්තුවක් වූ විට එය ("තෝටමය") යන වචනයෙන් හඳුන්වනු ලබයි. මෙසේ ඩූර්කයිම්ගේ ආගම පිළිබඳ විග්‍රහය සලකා බලන විට පැහැදිලි වන තවත් අදහසක් නම්, එය අදියර ගණනාවක් ඔස්සේ ගමන් කර අවසානයේ ආගම යැයි හඳුනාගත හැකි සංස්ථාවක් සංවිධානයක් දක්වාම පැමිණ ඇති බවය. එනම්,

(1) ශුද්ධ වස්තුවක පැවැත්ම
(2) එම ශුද්ධ වස්තුව පිළිබඳ විශ්වාසය
(3) එම විශ්වාසය පදනම් කොට ගෙන ඇති කරගනු ලබන පිළිවෙත්
(4) එම පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනඟා ගත් සංවිධානයන් වේ.

ආගම පිළිබඳ රැල්ප් එච්. ටර්නර් නම් සමාජ විද්‍යාඥයා ද මෙයටම සමාන අදහසක් ඉදිරිපත් කර ඇත. ඔහුට අනුව ආගම ශුද්ධ අති භෞතික දේ සම්බන්ධ වූ විශ්වාස හා යාතු කර්ම වටා ගොඩ නැඟී ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව ඇති තත්ත්වයන්, කාර්ය කොටස් හා ධර්මතාවයන් පිළිබඳ එකතුවකි. මෙම එකතුව හැදී ඇත්තේ ඇදහිලි හා 'වාද (Cult) පදනම් කරගෙන ය. ටර්නර්ගේ නිර්වචනය විග්‍රහාත්මකව සලකා බැලීමේ දී එය උප අංග කොටස් යටතේ කඩා දැක්විය හැකි බව පෙනේ. එම කොටස් ආගම ලෙසින් හඳුනා ගත හැකි බැව් ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි.

1. ශුද්ධ හා අධි භෞතික වූ සියලු ද (Scared and Supernatural)
2. විශ්වාස හා ඇදහිලි (Belief and Values)
3. ඇදහිලි වාද හා යාතුකර්ම (Cults and Rituals)

ටයිලර් හා ටර්නර් යන සමාජ මානව විද්‍යාඥයින් දෙදෙනාගේ ම ආගම පිළිබඳ මෙම නිර්වචනවල සඳහන් කරුණු ශ්‍රී ලංකා සමාජයේ ආගම තේරුම් ගැනීමට ඉවහල් කරගත හැකිය. ශුද්ධ වස්තූන් නැත්නම් ශුද්ධ අධි භෞතික බලවේගයක්, එසේ නැත්නම් ශුද්ධ පුද්ගලයන් කේන්ද්‍ර කරගෙන ගොඩ නැඟීම පොදුවේ සෑම ආගමකම දක්නට ලැබෙන දෙයකි. මිනිසුන් වශයෙන් අපට අවශ්‍ය පරිදි පාලනය කරගත නොහැකි විශේෂ බලයක් ඇත්නම් එයට ශුද්ධ තත්ත්වයක් ආරෝපණය කිරීමට බොහෝ විට අප පෙළඹේ. නො එසේ නම් ශුද්ධ යැයි පිළිගත් පුද්ගලයෙකුගේ පහස ලැබූ කවර හෝ දෙයක් අපේ ආගම්වල ශුද්ධ වස්තුවකි. දළදා වහන්සේ, ශ්‍රී මහා බෝධියේ කොළ, රුවන් වැලි දාගැබ ආදිය බෞද්ධයන්ගේ සුභ සංකේත බව අපි දනිමු. එමෙන්ම කුරුසිය, ක්‍රිස්තියානි බැතිමතුන්ට ද, ශිව ලිංගය හින්දු බැතිමතුන්ට ද ශුද්ධ වස්තූන්වේ.

විශ්වාසයන් මගින් කරන්නේ මෙම ශුද්ධ වස්තූන්ට පණක් ලබාදීමයි. විශ්වාස පිළිබඳ විවරණයක් හැම ශුද්ධ වස්තුවකටම ඇත. දළදා වහන්සේ ගතහොත් ඒ පිළිබඳ පවතින අපූරු විශ්වාස කොතරම් දැයි අපි දනිමු. දෙවියන් පිළිබඳ ධූරාවලිය, ලෝකය වටා පිහිටා ඇති ආකාරය ආදී සියල්ලම ගැන යම් විශ්වාස වෙන් වෙන් වශයෙන් ගොඩ නැඟී ඇත.


එම විශ්වාස පදනම් කොට යම් යම් පුද පූජා ද එම පුද පූජා කිරීම සඳහා ක්‍රමානුකූල ආයතනික රටාවක් ද ඇති වී ඇත.

## ශ්‍රී ලංකා සමාජයේ ආගම

ශ්‍රී ලංකා සමාජය තුළ ගොඩනැඟී පවතින ආගමික පදනම තේරුම් ගැනීමේ ලා වැදගත් වන කරුණකි; එයට ආවේණික වූ ඇදහිලි වාද ආකෘතිය (cult structure) තේරුම් ගැනීම මෙබඳු ආකෘතියක දැකිය හැකි මූලික ලක්ෂණ සතරක් වේ. එනම්,

1. ඇදහිලි වාදය ගරු කරන සමූහයේ සියලු දෙනාම මත සමාන වූ ශුද්ධ වස්තූන් හා අධි භෞතික බලවේග විශ්වාස කිරීම.
2. එම සමූහයට ගැනෙන සියලු දෙනාම එක හා සමාන සාරධර්ම පොදුවේ පිළිගැනීම.
3. එම සමූහයට ගැනෙන සියලු දෙනාම එක හා සමාන වූ යාතු කර්මවල යෙදීම.
4. එම ආකෘතිය යටතේ ගැනෙන සියලු දෙනාම තමන් එකම සමූහයක් ලෙස සිතීම ආදියයි.

මෙම ආකෘතික ලක්ෂණ සිංහල සමාජය තුළ හඳුනා ගත හැක්කේ ඔවුන්ගේ ව්‍යවහාරික වන්දන රටා ව ද තේරුම් ගැනීමෙනි. සිංහල ජනතාවගේ ව්‍යවහාරික වන්දනය හැඩගැසීමෙලා මූලික වූ සිදුවීමකි මහින්දගමනය. මිහිඳු හිමිගේ පැමිණීමට පෙර ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස මහින්දගමනය සමග මුළුමනින්ම යටපත් නොවුනා පමණක් නොව, සිංහලයාට නව ඇදහිලි වාද ආකෘතියක් නතාගැනීමට ද ඒවා ඉවහල් විය. යක්ෂ, භූත, දේව, බලවේගයන්ද



බණ ඇසීමේ පුරුද්ද අනාදිමත් කාලයක සිට ම


ගස් ගල් වැනි ස්වභාවික වස්තූන් ද දේවත්වයෙහි ලා සැළකීමත්, මළවුන් පිදීමත් එකල පැවති සිංහල ජන ඇදහිලි විය. මෙම ජන ඇදහිලි විශ්වාස කළ ජනයාට මිහිඳු හිමියන්ගේ ථෙරවාදී බුදු දහම එක් වරම පිළිගැනීම දුෂ්කර වීම නිසා ඔවුන්ගේ ලෞකික ඕනෑකම් ඉටුකර ගැනීමට උපකාරී වූ ඇදහීම් මෙම නව ථෙරවාදී ඉගැන්වීම් ද සමග සංකලනය කොට පිළිගැනීමට ඔවුන් පෙළඹුණු බව පෙනේ. මෙම සංකලනය තුළ සිංහලයේ ව්‍යාවහාරික ආගමික තත්ත්වය මැනවින් දිස්වන බව මානව විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි.

කවර සමාජයක හෝ වේවා සෑම සංස්කෘතික අංගයක් සම්බන්ධයෙන්ම මේ හා සමාන වූ සංකලනය වීමක් සිදුවීම ස්වාභාවික ය. මේ පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කර ඇති මානව විද්‍යාඥයෙකි. රොබට් රෙඩ්ෆීල්ඩ්. ඔහුට අනුව මහා සමාජයේ ප්‍රබුද්ධ පිරිස් නොබවන දහම මහා සම්ප්‍රදායයි. සාමාන්‍ය පොදු ජනයාගේ දහම චූල සම්ප්‍රදායයි. ශ්‍රී ලංකා සමාජය ගතහොත් මහා සම්ප්‍රදායේ සංස්කෘතිය නිරූපනය කරන්නේ මහින්දාගමනයත් සමග මෙරටට රැගෙන ආ ථෙරවාදී දර්ශණයයි. ප්‍රාග් බෞද්ධ යුගවල පැවති විශ්වාස සංකලනය කොට සකස් කර ගත් එම ථෙරවාදී දහම චූල සම්ප්‍රදාය යේ සංස්කෘතිය නිරූපනය කරයි. මෙම බෙදීමට අනුව සුප්‍රකට මානව විද්‍යාඥයකු වන ගණනාථ ඔබේසේකර මහතා ථෙරවාදී බුද්ධ ධර්මය මහා සාම්ප්‍රදායික ආගම ලෙසත්, සංකලනය වූ සිංහල බුද්ධාගම චූල සාම්ප්‍රදායික ආගම ලෙසත් වර්ග කර ඇත.


ථෙරවාදී බුද්ධාගම – මහා සාම්ප්‍රදායික ආගම

ප්‍රාග් බෞද්ධ විශ්වාස – චූල සාම්ප්‍රදායික ආගම

මෙම දෙකෙහි සංකලනය – සිංහල බුද්ධාගම යනුවෙනි. රොබට් රෙඩ්ෆීල්ඩ්ද



දන් දීම



ථෙරවාදී බුද්ධාගම – මහා සාම්ප්‍රදායික ආගම

මෙවැනි අදහසක් සංස්කෘතික පිළිගැනීම් සම්බන්ධව පෙන්වා දේ. එනම් මෙම සම්ප්‍රදායන් දෙකට අයත් අංග අන්‍යොන්‍ය වශයෙන් හුවමාරු වීමයි. චූල සම්ප්‍රදායට අයත් අංග මහා සම්ප්‍රදායට ඇතුළු වීම සර්ව විශ්වීයකරණය යනුවෙන්ද මහා සම්ප්‍රදායේ පවත්නා අංග චූල සම්ප්‍රදායට එකතු වීම සීමාන්තිකරණය ලෙසද ඔහු දක්වා ඇත. රිචඩ් ගොම්බ්‍රිච් (Gombrich) නම් මානව විද්‍යාඥයා ලාංකික ආගමික පසුබිම පිළිබඳව ඉදිරිපත් කර ඇති අදහස් ද මෙයටම සමාන ය. ඔහුට අනුව ලංකාවේ දක්නට ලැබෙන බුදු දහම බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙකකි.

1. ශ්‍රමණ බුදු දහම (Monastic Buddhism)
2. දේව විශ්වාස වලට සම්බන්ධ බුදු දහම (Thiestic Buddhism)

ගොම්බ්‍රිච්, ඔබේසේකර හා රෙඩ්ෆීල්ඩ් පෙන්වා දුන්නේ සමාජමය බෙදුමට වඩා ආගම තුළින් දැකිය හැක් බෙදුමකි. කෙසේ වුවද ඉහත සඳහන් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ ව්‍යවහාරිකව දැකිය හැකි ආගම වන්නේ මෙම දේව විශ්වාස වලට සම්බන්ධ ආගම බවය. ගොම්බ්‍රිච්ගේ අදහස මෙම අදහස් සියල්ල පොදු වශයෙන් සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා සමාජය තුළ දැකිය හැකි වන්දනය සමකාලීන සමාජ අවශ්‍යතා හා සමාජ තත්ත්වයන් පදනම් කොට ගොඩ නගා ගන්නක් බවයි. දිගු කාලීන ආගමික අරමුණු එලෙසින්ම පවත්නා අතර, කෙටි කාලීන ලෞකික ඕනෑකම් ඉටුකර ගැනීමට ආගම ඉවහල් කර ගැනීම එහිලා දක්නට ලැබෙන මූලික ලක්ෂණයයි. මෙම ලෞකික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා බලවත් පුද්ගලයන් පහදවා ගැනීමක් අවශ්‍ය වේ. එහිලා බලවත් පුද්ගලයන් කවුද ? ඔවුන් සතුව පවතින බලය ධූරාවලියක් හැටියට සකස් වී ඇත්තේ කෙසේද? යන්න පැහැදිලි කර ගැනීමට ග්‍රාමීය බෞද්ධයන් විසින් විශ්වය පිළිබඳව සකස් කර ඇති ආකෘතියෙන් පැහැදිලි වෙයි. ඒ මෙසේය.

**අනුභාවික ලෝකය** – පෘථිවිය, මහමුහුද, මිනිසුන්, සතුන්, ගස් කොළන් සහිත ලෝකය

**අන්තර් ලෝකය** – පුද්ගලයකු මරණය හා නැවත ඉපදීම අතර සිටින අන්තර් ලෝකය

**ආනුභවික නොවන ලෝකය** – බ්‍රහ්ම ලෝකය, අසුර ලෝකය, දිව්‍ය ලෝකය, නාග ලෝකය, ප්‍රේතලෝකය

ග්‍රාමීය බෞද්ධයාගේ ලෞකික ඕනෑකම් ඉටුකර ගැනීමට අවශ්‍ය බලය රාශිභූතව පවතින්නේ ආනුභවික ලෝකය නොබවන 'දේව ගණය' වෙතය. එසේ වුවද එහිලා ප්‍රධානත්වය හිමිවන්නේ බුදුන් වහන්සේට බවත්, බුදුන්ගෙන් වරම් ලබාගැනීමෙන් මෙම දේව ගණයට ක්‍රියාත්මක විය හැකි බවත් ගැමි බෞද්ධයා වැඩිදුරටත් පිළිගනී. ඒ අනුව සිංහල බුද්ධාගමේ ධූරාවලිය මෙසේ දැක්විය හැක.

1. බුදුන් වහන්සේ
2. මහා බ්‍රහ්මයා
3. ශක්‍ර දෙවි
4. සතරවරම් දෙවිවරු


5. ප්‍රාදේශීය දෙවිවරු
6. යක්ෂයෝ
7. ප්‍රේතයෝ

බුදුන් වහන්සේ දෙවියන් අතර ප්‍රධානියා වන ශක්‍ර දෙවියන්ට ධර්මය දේශනා කළ අතර ජනතාව ආරක්ෂා කිරීම සඳහා උන් වහන්සේ විසින් ශක්‍ර දෙවියන්ට වරම් දී ඇත. ශක්‍ර දෙවියන් විසින් ඒ සඳහා සතර වරම් දෙවිවරුන්ට බලය පවරා ඇත. මිනිසුන් විසින් අනුමෝදන් කරන පින් ලබාගෙනය, පෙරළා දෙවියන් ඔවුන්ට සෙත සලසන්නේ. මෙයින් පැහැදිලි වන්නේ, ගැමි බෞද්ධයාගේ අධිභෞතික බලවේග ක්‍රමානුකූලව ජන සමාජය තෙක් ගමන් කර ඇති බවයි. ඔවුන්ගේ ලෞකික ඕනෑකම් ඉටුකර ගැනීමට අවශ්‍ය මානසික පසුබිම හැඩ ගැසී ඇති බවයි. අනෙක් අතට දෙවිවරු ගම මට්ටමේ, ප්‍රාදේශික හා ජාතික මට්ටමේ දෙවිවරු ආදී වශයෙන් බලය අනුවද බෙදී ගොස් සිටිති. එම තත්ත්වය ද පෙරළා ගැමි බෞද්ධයාගේ ඕනෑකම් ඉටුකර දීමට ඇති, හැකියාව පෙන්නුම් කරන්නකි. ගැමි බෞද්ධයාගේ විශ්වය පිළිබඳ මතය හැඩගැසීමට උපකාරී වූ මෙම මනෝ මූලිකපසුබිම ව්‍යවහාරික වන්දනයන් බවට පත් වන්නේ යාතු කර්මයන් මගිනි. සිංහල බෞද්ධයා තමාට සිදුවන සියලුම හොඳ හෝ නරක තීරණය වන්නේ ප්‍රධාන හේතු තුනක් මුල් කරගෙන යයි පිළිගනී. එනම්,

1. ග්‍රහ ලෝක හොබවන දෙවිවරුන්ගේ බලපෑම
2. යක්ෂ ප්‍රේත ආදීන්ගේ බලපෑම
3. කර්මයේ බලපෑම යන්නයි.

කිසියම් හේතුවකට මෙකී හේතුන් තුනම හෝ දෙකක් හෝ එකක් හෝ බලපෑ හැකිය. කර්මය තරමට ම යක්ෂයින්ගේ හා දෙවියන්ගේ බලපෑම ද ප්‍රබල බව ගැමි බෞද්ධයා පිළිගන්නේ, පිරිසිදු ථෙරවාදී බුදු දහම තුළට සංකලනය වූ ඇදහිලි හා විශ්වාස සංකේතවත් කරමිනි. අනෙක් අතට එම බලපෑම් වලින් මිදීම සඳහා සුවිශේෂ යාතු කර්මයන් ද නියමව පවතී. මෙම යාතු කර්ම සිංහල ගැමි බෞද්ධයාගේ ජීවිතයේ එදිනෙද සෑම සිදුවීමකටම සම්බන්ධව පවතී. මෙසේ සිංහල ගැමි බෞද්ධ ජන ජීවිතය පුරාම දැකිය හැක්කේ, විශ්වාස හා යාතු කර්ම තුළින් හැඩ ගැසුණු චින්තනයකි.

තමන්ට තේරුම් ගත නොහැකි ජීවන කාරණා තේරුම් ගැනීමටත් ඒ ඒ ජීවන අවස්ථා වලට හොඳින් මුහුණ දීමටත්, ඔවුනට එම චින්තනය මහෝපකාරී විය. අනෙක් අතට කෘෂික කටයුතු වලදී සිදු කෙරෙන අභිචාර (Magic) ක්‍රියා පිටුපස ද මෙම ලෞකික ඕනෑකම් ඉටුකර ගැනීමේ ආගමික උනන්දුව දක්නට ලැබේ. විශ්වාස ඇදහිලි කෙම ක්‍රම, දේව පූජා ආදියෙන් සිංහලයාගේ පැරණි සාම්ප්‍රදායික තාක්ෂණය සකස් වූ නමුත්, නවීන විප්ලවයේ බලපෑම ලබා නූතන යන්ත්‍රෝපකරණ සහ නවීන තාක්ෂණය සිංහල ගමට පැමිණිය ද පැරණි



බුද්ධත්වය ලැබීමට පිටුදුන් බෝධිය වැඳීම

සිංහලයන්ගේ මනෝ මූලික වූ ආගමික පසුබිම මත ගොඩනංවා තිබූ සාම්ප්‍රදායික තාක්ෂණය මුළුමනින්ම වෙනස් වීම හෝ බිඳ වැටීම සිදු නොවිණ. ඒ වෙනුවට සිදුව ඇත්තේ සාම්ප්‍රදායික තාක්ෂණය තුළම නවීන තාක්ෂණය ද්‍රවීකරණය වීමය

**පැරණි ශ්‍රී ලංකා සමාජය තුළ පන්සලේ කාර්යය භාරය.**

සාම්ප්‍රදායික සිංහල සමාජයේ සෑම අංශයක්ම ක්‍රියාත්මක වූයේ ත්, ද්‍රවීකරණයට පැවතියේත් පන්සල කේන්ද්‍ර කරගෙන ය. මහින්දාගමනයෙන් පසුව ලක්දිව මුල් බැස ගනු ලැබූ භාෂාව, කලා ශිල්ප, සංගීතය, නාට්‍ය සහ වෙනත් සංස්කෘතික අංග ලක්ෂණයන් සම්භාව්‍ය ඉන්දු සභ්‍යත්වයේ ආභාසය ලබා පෝෂණය වූ අතර මෙහිලා පන්සල සෘජුව එකී අංශ හා බැඳුණු සමාජ ජීවිතය පාලනය කළ බැව් පෙනේ. මූලිකව සලකතොත් කුඩා දරුවන්ට අවශ්‍ය අධ්‍යාපන කාර්යය ඉටු කිරීමේ ඒකායන සංස්ථාව ලෙසින් කටයුතු කලේ ද පන්සල බැව් පෙනී යයි. විශේෂයෙන් පැරණි ආගමික සිද්ධාන්තයන් තුළින් උපන ලද ජනප්‍රිය බුදු සමයෙහි එන මහිමතාන්තර වලට ගැලපෙන පරිද්දෙන් හැඩ ගැසී තිබූ පුරාණ ආගමික අධ්‍යාපන ක්‍රමය තුළ දැඩි ලෙස දැකිය හැකි වූයේ හොඳ නරක පිළිබඳ ඇගයුමකි. හොඳ යනුවෙන් නිර්වචනය කරනු ලැබූ ධර්මතා සමුදයම සෘජුවම ආගමික සිද්ධාන්ත විසින් සාධාරණීකරණය කරනු ලැබූ ඒවා වූ අතර එයට ප්‍රතිපක්ෂ වූ චර්යාවන් රැසක් 'නරක' ලෙස වර්ග කර දක්වන ලදී. අනෙක් අතට මෙම හොඳ නරක යන සීමින බෙදුම පන්සල විසින් වඩාත් අර්ථාන්විතව ජනතාවට කාවැද්දීම සඳහා යොද ගත් තවත්

සංකල්පයක් වූයේ, මෙලොව හා පරලොව පිළිබඳ සංකල්පයයි. මෙලොව හා පරලොව ජීවිත දෙකේම සාර්ථකත්වය සමබර දියුණුවකට අවශ්‍ය වේ. එය කිරීමට බණ දහම් මූලික කර ගත් ඉගෙනුම් රටාවක් අවශ්‍ය විය. එවකට පැවති සරල සමාජය තුළ මෙබඳු අධ්‍යාපන පරිපාටියක් තුළින් එම කාර්යය පහසුවෙන්ම කළ හැකි විය.

අනෙක් අතට සමාජීය වශයෙන් සාම්ප්‍රදායික සමාජය තුළ සමාජ එකමුතුව හෙවත් අනුකලනය ද පන්සල මූලික කරගෙන ඇති වූ බැව් පෙනේ. සමකාලීන වශයෙන් එහි ලා දැකිය හැකි වූ ලක්ෂණයක් නම්, සමාජයේ දනුම ද බහුතර පිරිස සඳහා ශ්‍රව්‍ය ගෝචර රටාව මත බිහිවූ බණ කථා පදනම් කරගත් සාහිත්‍යයක් බිහිවූ බවයි. මෙම බණ සාහිත්‍යය සමාජයීය සම්බන්ධතා පවත්වා ගැනීමේ දී අංශ ගණනාවකින් උපකාරී විය.

අත් අකුරු නොදත් නිසා මෙම ශ්‍රව්‍ය ගෝචර සාහිත්‍ය බහුතර පොදු ජනතාවගේ සමාජානුයෝජනයට කෙළින්ම බලපෑවේ ය. එමෙන්ම පොදු ජනතාවගේ සිතුම් පැතුම් හා බැඳී පවතින යම් යම් ජන කථා, ජාතක කථා හා විශ්වාස ආදී සිංහල බුද්ධාගමේ මූලිකාංගයන් පදනම් කරගත් ආකල්ප රටාව තහවුරු වීමට මෙම සාහිත්‍යයෙන් විශාල පිටුබලයක් ලැබුණු බව ද පෙනේ. දනය, ඉවසීම, බෙද හද ගැනීම, පරහට වැඩ සෑදීම, සමගිය වැනි ගුණාංග අභ්‍යන්තරීකරණය කරගත් ජනකායක් ඇතිවීමට මෙම පසුබිම බොහෝ දුරට හේතු කාරක වීම එයට හේතුවයි. මේ හැර සමාජ එකමුතුව සම්බන්ධව සාම්ප්‍රදායික පන්සලෙන් සිදුවූ තවත් කාර්යයක් වූයේ සිතුවම් හා මූර්ති මගින් පුද්ගලයාගේ පෞරුෂය හැඩ ගැසීමට කරනු ලැබූ බලපෑමයි. බොහෝ ජන කථා හෝ ආගමික සිද්ධාන්ත වැනි දේවල් මෙම සිතුවම් වලට හෝ නාට්‍ය වලට වස්තු විෂය වූ බැව් පෙනේ. කළගුණ සැලකීම, මව්පිය උපස්ථානය, සොරකම් කිරීමේ පල විපාක, සතුන් මැරීමේ පල විපාක ආදී දේවල් විහාර ගෙවල ඇති චිත්‍ර හා මූර්ති කැටයම් වලින් ප්‍රකාශ විය. කුඩා දරුවන්ගේ ප්‍රාථමික සමාජානුයෝජනයේ දී මෙම සිතුවම් හා මූර්ති මගින් එකල සමාජයේ පොදුවේ පිළිගනු ලැබූ ධර්මතා පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමට මෙමගින් ඉඩ සැලසිණ. අනෙක් අතට පොදුවේ සමාජය විසින් නරක යයි සම්මත කරනු ලැබූ ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමට අවිඥානික සමාජ පාලනයක් ද මෙමගින් උද්ගත කෙරිණි.

සාම්ප්‍රදායික සමාජය තුළ නීතිය හා සාමය රැකීම ද ගමේ නායකයන් ලෙස පිළිගැනුණු ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් සිදුවිය. එමෙන්ම එවකට පවත්වනු ලැබූ යම් යම් උත්සව අවස්ථාවන්හිදී ද පන්සල ජනතාවට ඉතාම සමීපව කටයුතු කිරීම විශේෂ ලක්ෂණයක් විය. වර්ෂයේ මාස කිහිපයක්ම ගොවිතැන් කටයුතු කර, ලද විවේකයෙන් පසුව ගැමියන් සතුටක් ලබා ගැනීම සඳහා පැමිණියේ පන්සල වෙතයි. පැවති අර්ථ ක්‍රමය මෙසේ සරල කෘෂි අර්ථ ක්‍රමයක් වීමත් ගැමියන්ට අවශ්‍ය වූ විවේකය නිරායාසවම ලැබීමත් මේ තත්වය වඩාත් පහසු කරන්නක් විය. විශේෂයෙන්ම සංකීර්ණ කාර්යය දම රැසකට පැටලී කටයුතු කිරීමට පැරණි ගැමියාට සිදු නොවීම නිසා මෙවැනි ආගමික කටයුතු සඳහා ප්‍රමාණවත් වේලාවක් කැප කිරීමට ද ඔහුට අපහසුවක් නොවිණ. රාත්‍රී පහන් වන තෙක්ම බණ කීම මෙන්ම, බණ ඇසීම ද දුෂ්කර නොවිණ. ආසන දෙකේ බණ ගැටලු සහිත ආසන පහේ විවාද බණ ආදී තරග කාරී ස්වරූපයකින් ධර්ම දේශනා පැවැත්වීමේ සම්ප්‍රදය ප්‍රචලිත විය. ගම්වර හා පූජා කරනලද කෙත් වතු වලින් පන්සල පෝෂණය වීමත්, තමන්ගේ පරිභෝජනය පිණිස පවත්වාගෙන ගිය කුඹුරු පදනම් කරගත් කෘෂි අර්ථ ක්‍රමයකින් ජනතාව සමෘද්ධිමත්ව සිටීමත් යන කරුණු දෙක නිසා මෙසේ පැරණි සමාජය තුළ පන්සල බහු කාර්ය ආයතනයක් ලෙස සුවිශාල වැඩ කොටසකට උර දී සිටි සංස්ථාවක් විය.

නූතන වෙනස් වීම

මෙම තත්ත්වය ක්‍රමානුකූලව වෙනස් වීමට ලක් වූයේ වාණිජත්වය ගම් දනව් කරා පැමිණීමත් සමගයි. එහිලා මූලික වූ සාධකයක් වූයේ මුදල් මත පදනම් වූ අර්ථ ක්‍රමය මගින් මුදල් සංසරණයට ජනතාව හුරු



පන්සලත් ජනතාවත් අතර සමීප සබඳතා

කිරීමයි. මෙහි කෙටි කාලීන ප්‍රතිඵලය වූයේ තමන්ගේ පරිභෝජනය ඉක්මවා ගිය 'අතිරික්තයක් නිපදවා එය මුදල් බවට පත්කර ගැනීමට ජනතාව උනන්දු වීමයි. මෙම 'පුරුද්ද' හේතු කොට ගෙන වැඩි වැඩියෙන් මුදල් උපයා ගත හැකි බෝග මහා පරිමාණ මට්ටමින් වගා කිරීම සිදුවිය. අනෙක් අතට කාලානුරූපව හටගත් අනෙක් දේශපාලන හා සංස්කෘතික බලපෑම හේතුවෙන් ද පවුල නම් ඒකකයේ ද යම් යම් වෙනස් කම් ඇති වන්නට හේතුවිය. එමෙන්ම මෙතෙක් පවුලේ පරිභෝජන කාර්යය කරනු ලැබූ සීමාසහිත කුඹුරු වෙනුවට වෙනත් වෙනත් ආර්ථික ඉපයුම් කරා ඇදී යාම ද දක්නට ලැබිණ. මෙම ආර්ථික නිෂ්පාදන මාර්ග පැන නැගීම ක්‍රමානුකූලව සිදුවූ නවත් අතිරේක සාධක රැසක ප්‍රතිඵලයක් ද වූ අතර අවසානයේ ඒවා පිළිබඳ ව උග්‍ර තරගයක් ද හට ගැනිණ. මෙම ක්‍රියාවලිය කීප ආකාරයකින්ම පන්සලට බලපෑ බැව් පෙනේ. ඉන් පළමු වැන්න නම් මිනිසුන් ක්‍රම ක්‍රමයෙන් මුදල් අර්ථ ක්‍රමයට ඇතුළු වන්නට වන්නට නැවතත් ඔවුන් පන්සල වෙත ඇද බැඳ තබා ගැනීමට අලුත් උපක්‍රම ද අවශ්‍ය වීමයි.

පෙරදී පන්සලේ ආගමික කටයුතු සඳහා අවංකවම ඉඩ කඩම් මිළ මුදල් පරිත්‍යාග කළ මිනිසුන් ඒවෙනුවට ආරාධනා ලබා තරගයක් කොට ප්‍රසිද්ධියේ මුදල් පරිත්‍යාග කරන කොටසක් බිහිවිය. මුල් ගල් තැබීමේ උත්සවය, තෙත් තැබීමේ උත්සවය, උළු සෙවිලි කිරීමේ උත්සවය, ආදී සෑම අවස්ථාවක්ම ආරාධනා මත කෙරෙන තත්වයකි. බිහිවූයේ මල් බඳුන් වෙන්දේසි ක්‍රමය, සල්පිල් පැවැත්වීමේ ක්‍රමය, පන්සලේ අවශ්‍යතා සඳහා මුදල් උපයා ගැනීමේ ක්‍රම ලෙස යොදා ගන්නා ලදී. මෙයින් පෙනෙන්නේ සමාජය තුළට ඇතුළු වූ තරගය පුද්ගලයන් වශයෙන් ද එකිනෙකා පරයා කැපී පෙනීම දක්වාම පැමිණි බවයි. එම පැමිණීම පන්සල තුළදී මැනවින් ප්‍රදර්ශණය වන අවස්ථාවන් ගණනාවක්ම දැක ගත හැකිය. සංවිධානය වූ පිරිසක් හෝ කිහිප දෙනෙක් මල් බඳුන වෙනුවෙන් තරග කිරීම, භාණ්ඩ මිළ ඉහළ දැමීම, භාණ්ඩ මිළට ගැනීම සඳහා තරග කිරීම, පන්සලේ දී දැකිය හැකි විය. එමෙන්ම ගැමි සමාජය තුළ ප්‍රයෝජනවත් ආර්ථික භාණ්ඩයක් වූ පොල් එක් රැස් කොට පන්සලේ තොරණක් සාද වෙන්දේසි කිරීම ද සිදුවිණ. මේ හැර, පන්සලට මුදල් උපයා ගැනීමට මිනිසුන් මෙවැනි ව්‍යාපාරික අංශ වලට යොමු කරවන ගමන්ම ඔවුන් බොහෝ වේලාවක් පන්සල තුළ රඳවා ගැනීම සඳහා ද සුවිසි විවරණ බණ හෝ බණ සහිත නැටුම් ආලවක දමනය වැනි දෑ නාට්‍යාකාරව රඟ දක්වනු ලැබිණ.

පන්සලේ නූතන වෙනස්කම් සාකච්ඡා කිරීමේ දී සඳහන් කළ යුතු තවත් අංශයක් නම් මිනිසුන්ගේ දිවි පෙවෙතට ඇතුළු වූ කාර්යය බහුලත්වයයි. නූතන සමාජය තුළ දැකිය හැකි මූලික ලක්ෂණයක් වනුයේ ගම අතහැර නගර කරා ඇදෙන පිරිසෙහි ක්‍රමානුකූල වැඩිවීමකි. මෙම ගම අතහැර යාම ක්‍රම කිහිපයකට සිදුවෙයි. එකක් නම් හිමිදිරි උදයේම නගරයේ රැකියා සඳහා පිටත් වීමයි. අනෙක් අතට නගරයේ යාන්ත්‍රීකරණය වේගයෙන්ගමට පැමිණීමත් සමග ගම තුළ තමන්ගේ ශ්‍රමයෙන් යම් යම් රැකියාවල යෙදී සිටි විශාල පිරිසකට රැකියා අහිමි වන තත්වයක් ද පවතී. එහි ප්‍රථිපලය වන්නේ රැකියා විරහිත පුහුණු හෝ නුපුහුණු ශ්‍රමිකයන් විශාල පිරිසක් ගම වෙතින් තල්ලු වීමයි. (තල්ලු සාධකය) අනෙක් අතින් නගරය තුළ ඉදිවන නව තාක්ෂණයට ගම් වල සිටින මෙම විශාල ශ්‍රම පිරිස ලාබදායී සම්පතක් වන නිසා, වහ වහා ඔවුන් උරා ගැනීමක් කරනු ලබයි. (ඇද ගැනීමේ සාධකය) මෙම සාධක දෙකේම ක්‍රියාකාරීත්වය අඩු වැඩි වශයෙන් සිදුවන තත්වයක් යටතේ පන්සල සමග පවත්වන සබඳතාවයන් ද මුළුමනින්ම වෙනස් මුහුණු වරක් ගැනීම ස්වාභාවික ය. එද පන්සලේ කෙරුණු ආගමික කාර්යයන් රැසක්ම අද ගුවන් විදුලිය මගින් ඉටුකර ගත හැකිය. පරිත්‍රාණ ධර්ම දේශනා, ධර්ම දේශනා ආදිය පමණක් නොව ජාතක කථා බෝධි පූජා වැනි පුද සිරිත් ද මෙසේ අජීවි යන්ත්‍රණ මගින් ඉටුකර ගැනීමට නූතන කාර්යය බහුල මිනිසා හුරුවී සිටී.

අනෙක් අතට රසාස්වාදනය හා සමාජ එකමුතුව කෙරෙහි සමාජයට පන්සල මගින් කරනු ලැබූ බලපෑම ද වෙනස් වෙමින් නොපවතී ද ? විනෝදය සඳහා නූතන මිනිසාට ගුවන් විදුලිය යන්ත්‍රණයට අමතරව, රූපවාහිනිය මෙන්ම සිනමාහල් හා නාට්‍යාගාරය ද පවතියි. පැරණි සමාජයේ පන්සලේ උත්සවයක් සංවිධානය කිරීමෙන්, ලැබූ සාමූහික සතුට වෙනුවට නූතන සමාජයේ හුදකලාව පැය ගණනක් රූපවාහිනිය නැරඹීම තුළින් ආත්මීය වින්දනයක් ලබා ගැනීමට නූතන මිනිසා පුරුදු වී සිටී.

මෙසේ පන්සල සතු පැරණි කාර්ය භාර්යය නූතනයේ වෙනස් වීම නැත්නම් නවීකරණයට ලක්වීම මුදල් අර්ථ ක්‍රමයේ හා සමාජ සංකීර්ණත්වයෙහි ක්‍රමානුකූලවූ ප්‍රථිපලයකි. එසේ වුව ද මෙබඳු වාතාවරණයක් යටතේ ද සමාජ එකමුතුව සම්බන්ධව ආගම වෙතින් ඉටුවිය යුත්තේ කවර කාර්යයක් ද ? යන්න විමසා බැලීම වැදගත්ය.

නූතන සමාජ ජීවිතයේ ඉස්මතුව පෙනෙන ප්‍රධාන ලක්ෂණයක් වනුයේ සංක්‍රමණයයි. ජාත්‍යන්තරව දැකිය හැකි සංක්‍රමණශීලීත්වයට අමතරව සමාජ ව්‍යුහයේ සෑම අංශයක්ම වඩාත් දියුණු යයි පිළිගනු ලබන යම් යම් ස්ථර කරා වේගයෙන් ගමන් කරමින් සිටී. අධ්‍යාපන මාධ්‍යයන් ගෙන් බැලුවත්, එක ලක්ෂණයක හිද නවත් තැනකට දිව යන මනුෂ්‍ය ප්‍රවාහයකි දක්නට ලැබෙන්නේ. මෙම සංක්‍රමණ තුළින් ධවනිත වන අදහසක් නම් සීමාන්තික පුද්ගල අරමුණු මත දිවෙන බළකායක් සමාජය තුළින් බිහිවන බවයි. නොඑසේ නම් එයට අනුරූප පරිදි සමාජ ව්‍යුහය සකස් වී ඇති බවයි. මෙවැනි තත්වයක් යටතේ නූතනයෙහි පන්සල නම් සංස්ථාවට පැවරී ඇති වගකීමක් වනුයේ මම බළකාය හිතකර පරිද්දෙන් වැඩෙහි යොදවා ගැනීමයි. ඔවුන් අපේක්ෂා කරන ජීවන අරමුණු ඉටුකර ගැනීමට පන්සල පාරගෞතික ආයතනයක් නොවී කටයුතු කිරීමෙන් මේ කාර්යයට පහසුවක් ඇතිවේ. පළමුව ඔවුන්ගේ හා ඔවුන්ගේ පවුල් වල ප්‍රශ්න තේරුම් ගැනීම ද වැදගත් ය. පාරිගෞතික සැප සදන ස්ථානයක් නොවී, නූතන පන්සල මිනිසාගේ ලෞකික සුවයට දිරි දෙන ඔවුන්ගේ ජීවිතය පිළිබඳ ප්‍රශ්ණ තේරුම් ගත්, ආයතනයක් ලෙස කටයුතු කළ යුතුයි.

වේගයෙන් වෙනස් වන සමාජයක වෙසෙන ජනතාවගේ සිතුම් පැතුම් ද එපරිදීම වෙනස් වීම ස්වභාවිකය. එම වෙනස් වීම අවබෝධ කර ගත හැකි විධිමත් නායකත්වයක්, පන්සල වෙතින් මතුවේ නම් පන්සල වටා ගම අනුකලනය කිරීමේ දී මතුවන බොහොමයක් ගැටළු තුරන් වේ යයි සිතිය හැක.

ආශ්‍රිත ග්‍රන්ථ

1. Adams. J. (ed) A Reader's Guide to the Great Religions, New York, 1965
2. Tylor, E.B. Primitive culture, John Murray, London 1871.
3. Durkheim, E. The Elementary Forms of Religious life. Glencoe Free Press 1954.
4. රත්නපාල, නන්දසේන, සමාජ විද්‍යාවේ මූල ධර්ම, සීමාසහිත ලේක්හවුස් ප්‍රින්ටර්ස් සහ පබ්ලිෂර්ස්, කොළඹ 2.
5. Karunatilake, W.S. The Religionsmen of Buddhists in Sri Lanka, Belief and Practices, John Ross Castee, ed. Religionsmen in Sri Lanka Murya Institue, Colombo 1979.
6. මේ පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීම සඳහා අතුකෝරළ කරුණාතිස්ස සමාජ විමසුම අංක 03, 1985 කලාපය පේරාදෙණිය විශ්ව විද්‍යාලය, විශ්වය පිළිබඳ මතය හා සමාජ ව්‍යුහය ගැන ග්‍රාමීය බෞද්ධයන් ආශ්‍රිත විමර්ශණයක්.

ආචාර්ය දයා අමරසේකර
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.